දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි ප්‍රථම භාග (බාහිර) පරීක්ෂණය
2011 ඔක්තෝබර්/නොවැම්බර්
General Degree Examination in Arts (External) Part I
October/November 2011

ආවිසා 2.2 - සාර්ව ආර්ථික න්‍යාය
ECG 2.2 - Macro Economic Theory

කාලය පැය තුන යි.

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
ගණක යන්ත්‍ර භාවිතයට අවසර නැත.
(නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.)

---

(01) (I) ව්‍යාපාර චක්‍රයක් සම්බන්ධ පහත සඳහන් දෑ පැහැදිලි කරන්න.
- අ. නිර්වචනය (Difinition)
- ආ. ආර්ථික වෘද්ධිය සහ උච්ඡාවචන (Growth and Fluctuations)
- ඇ. ප්‍රධාන අවධීන් (Phases)
- ඈ. විභව දළ ජාතික නිමැවුම හා දළ ජාතික නිෂ්පාදිත පරතරය (Potential GNP & GNP Gap)

(එක් කොටසකට ලකුණු 04 බැගින්)

(II) ආර්ථික වෘද්ධිය පිළිබඳ න්‍යායන්ට වඩා ආර්ථික උච්ඡාවචන පිළිබඳ න්‍යායන් දැඩි සංකීර්ණ බවකින් යුක්තය යන අදහස විමසන්න.

(ලකුණු 04)

(02) "කේන්සියානු අදහස්වලට අනුව ආර්ථිකයක නිමැවුම, සේවා නියුක්තිය හා මිල මට්ටම යන සාර්ව ආර්ථික විචල්‍යයන් තීරණය කරනු ලබන ප්‍රධාන සාධකය වනුයේ සමාහාර ඉල්ලුමයි."
අවශ්‍ය තන්හි ප්‍රස්තාර සටහන් උපයෝගී කොට ගනිමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 20)

(03) කල්පිත ආර්ථිකයක සමාහාර පරිභෝජනය පිළිබඳ පහත සඳහන් දත්ත ඔබට සපයා ඇත.

| වැය කළහැකි ආදායම (Yd) | පරිභෝජනය (C) |
|---|---|
| 1000 | 800 |
| 1200 | 940 (රුපියල් දශ ලක්ෂ) |

ඉහත දත්ත ඇසුරින්,

(අ) පරිභෝජන ශ්‍රිතය ව්‍යුත්පන්න කරන්න.

(ලකුණු 08)

(ආ) රුපියල් දශ ලක්ෂ 400, 600, 800 හා 1000 යන ආදායම් මට්ටම්වල දී පරිභෝජනය (C) ආන්තික පරිභෝජන නැඹියාව (MPC) සහ සාමාන්‍ය පරිභෝජන නැඹියාව (APC) යන අගයන් ගණනය කරන්න.

(ලකුණු 06)

(ඇ) ඉහත පරිභෝජන ශ්‍රිතයේ ස්වායත්ත පරිභෝජනය රු.ද.ල. 200 දක්වා වැඩි වුවහොත් පරිභෝජන ශ්‍රිතය විතැන් වන ආකාරය ප්‍රස්තාර සටහනක දක්වන්න.

(ලකුණු 06)

(04) "ඉල්ලුම නිර්මාණය කරනු ලබන්නේ සැපයුම විසිනි."

"සැපයුම නිර්මාණය කරනු ලබන්නේ ඉල්ලුම විසිනි."

අවශ්‍ය තන්හි ප්‍රස්තාර සටහන් උපයෝගී කොට ගනිමින් ඉහත පරස්පර ප්‍රකාශ පදනම් කර ගෙන ගොඩනැගී ඇති න්‍යාය පද්ධතීන් දෙක පැහැදිලි කරන්න.

(ලකුණු 20)

(05) ආර්ථිකයක උද්ධමනය පිළිබඳ ඉහත සඳහන් ප්‍රකාශ විමසන්න.

(අ) සෑම මිල ඉහළ යාමක් ම උද්ධමනයක් නොවේ.

(ආ) මුදල් සැපයුම හා මිල මට්ටම අතර සෘජු සම්බන්ධතාවක් ඇත.

(ඇ) මුදල් සැපයුම හා මිල මට්ටම අතර ඇත්තේ වක්‍ර සම්බන්ධතාවකි.

(ඈ) උද්ධමනයක් ඇති විය හැක්කේ පූර්ණ සේවා නියුක්තියෙන් ඉක්බිතිවය.

(ඉ) උද්ධමනය ආර්ථිකයක සම්පත් බෙදීයාමේ ආකාර්යක්ෂමතා ඇති කරයි.

(එක කොටසකට ලකුණු 04 බැගින්)

(06) "ආර්ථිකයක පොලී අනුපාතිකය තීරණය වන ආකාරය විග්‍රහ කිරීමේ දී සම්භාව්‍ය චින්තකයන් මූර්ත සාධක පමණක් ද කේන්ස්වාදීන් මූල්‍යමය සාධක පමණක් ද අවධාරණය කර ඇති අතර නව සම්භාව්‍ය සංස්ලේෂණය (Neo-Classical Synthesis – ISLM) මෙම අංශ දෙකම සැලකිල්ලට ගෙන ඇත."

ඒ ඒ න්‍යායන් සැසඳෙන පරිදි ඉහත ප්‍රකාශය විමසන්න.

(ලකුණු 20)

(07) "ආදායම පුද්ගල පරිභෝජනය තීරණය කරනු ලබන ප්‍රධාන සාධකයක් වුව ද ජේම්ස් ඩූසන්බරි (James Dusenbury) සහ මිල්ටන් ෆ්‍රීඩ්මාන් (Milton Friedman) තම විග්‍රහයන් හි දී මෙම සංකල්පය විග්‍රහ කර ඇත්තේ දෙ ආකාරයකටය."

මෙම ප්‍රකාශය ඔබ පැහැදිලි කරන්නේ කෙසේ ද?

(ලකුණු 20)

(08) ඇමෙරිකානු ඩොලරය හා ශ්‍රී ලංකා රුපියල අතර කල්පිත විනිමය අනුපාතිකයක් පදනම් කර ගනිමින්,

(අ) විනිමය අනුපාතික අධිතක්සේරු වීමක් යන්න පැහැදිලි කර එවැනි තත්ත්වයක් නිවැරදි කිරීම සඳහා මූල්‍ය අධිකාරියට ගත හැකි පියවර දක්වන්න.

(ලකුණු 08)

(ආ) ශ්‍රී ලංකා රුපියල ප්‍රතිප්‍රමාණය වීමක් සිදු විය හැකි ආකාරය විස්තර කර එමගින් ශ්‍රී ලංකාවේ ආනයන හා අපනයන සම්බන්ධව න්‍යායාත්මකව අපේක්ෂා කළ හැකි බලපෑම් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ඈ) විනිමය අනුපාතික අවප්‍රමාණය කිරීමක් (Devaluation) හා අවප්‍රමාණය වීමක් (Depreciation) අතර වෙනස පැහැදිලි කර අවප්‍රමාණයක් හේතු කොට ගෙන ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාමට කවර ආකාරයේ බලපෑමක් ඇති විය හැකි දැයි දක්වන්න.

(ලකුණු 07)

(09) කිසියම් කල්පිත ආර්ථිකයකට සම්බන්ධ සාර්ව ආර්ථික දත්ත සමහරක් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| රාජ්‍ය වියදම් | (G) | = | 390 |
| පෞද්ගලික ආයෝජන | (I) | = | 70 + 150 i |
| ඉතුරුම් | (S) | = | -40 + 0.25 Yd |
| ශුද්ධ බදු | (Tn) | = | 0.2 Y |
| අපනයන | (X) | = | 60 |
| ආනයන | (M) | = | 20 + 0.1 Y |
| ගණුදෙනු මුදල් ඉල්ලුම | ($L_1$) | = | 0.4 Y |
| සමපේක්ෂණ මුදල් ඉල්ලුම | ($L_2$) | = | 100 – 40 i |
| මුදල් සැපයුම | (Ms) | = | 500 |

(වටිනාකම රුපියල් දශ ලක්ෂ වලිනි)

I. භාණ්ඩ හා මුදල් වෙළඳපොළ වල සමතුලිතතාව දැක්වෙන ශ්‍රිත ව්‍යුත්පන්න කරන්න.

II. සමස්ත සමතුලිත අවස්ථාවට අනුරූප පොලී අනුපාතිකය හා ආදායම් මට්ටම ගණනය කරන්න.

III. රට තුළ ආර්ථික පසු බෑස්මක් හේතු කොට ගෙන අපනයන රු.ද.ල. 20 කින් පහත වැටීම නිසා සමතුලිත ආදායම් මට්ටමට හා පොලී අනුපාතිකයට ඇති වූ බලපෑම ගණනය කරන්න.

IV. උද්ධමන අනුපාතිකය පහත දැමීමේ අරමුණ ඇතිව රාජ්‍ය වියදම් රු.ද.ල. 16 කින් පහත දැමීමට තීරණය කර ඇත. මෙම තීරණය නිසා ඇති විය හැකි ආදායම් හා පොලී අනුපාතික ප්‍රතිවිපාක ගණන් බලන්න.

(එක කොටසකට ලකුණු 05 බැගින්)

(10) I. එය පදනම් වූ උපකල්පන හා තර්කයන් පැහැදිලිව දක්වමින් භාණ්ඩ දෙකක්, රටවල් දෙකක් හා නිෂ්පාදන සාධක එකකින් යුත් ආදර්ශයක් තුළ සාපේක්ෂ පිරිවැය වාසි න්‍යාය පිහිටුවන්න.

(ලකුණු 10)

II. ඒ මගින් අපේක්ෂිත වෙළඳ ප්‍රදේශය, දෙරටෙ හි වෙළඳ අනුපාතය ආනයන හා අපනයන ප්‍රමාණ සහ වෙළඳාමේ වාසි තීරණය කරන්න.

(ලකුණු 05)

III. සාපේක්ෂ පිරිවැය වාසි න්‍යායේ නිගමනය කෙටියෙන් දක්වන්න.

(ලකුණු 05)

***********************************